# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2023 ජූලි මස 14 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2023.07.19 දින නිකුත් කරන ලදී)**


# සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 205 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) එම නඩුවේ අදාළ පාර්ශ්වකරුවන් නඩුවේ නඩු තීන්දුවේ හෝ අවසන් තීන්දු ප්‍රකාශයේ සහතික පිටපතක් ඉල්ලුම් කරන අවස්ථාවක දී, ඒ එක් එක් පාර්ශ්වකරු වෙත එහි එක් සහතික පිටපතක් ගාස්තු අයකිරීමෙන් තොරව නිකුත් කිරීම; සහ

(ආ) අධිකරණයක් විසින් ඉලෙක්ට්‍රොනිකව නිකුත් කරන ලද හෝ සම්ප්‍රේෂණය කරන ලද ලේඛනයක්, අත්සන් තබන ලද සහ මුද්‍රාව තබන ලද ලේඛන ලෙස පිළිගැනීම සහ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ සහ බලය පැවරී ඇති වෙනත් නිලධරයන්ගේ ඉලෙක්ට්‍රොනික අත්සන් පිළිගැනීම,

සඳහා විධිවිධාන සැලසීම වේ.

# සිවිල් නඩු විධාන සංග්‍රහය
## (සංශෝධන)

එල්.ඩී.-ඕ. 44/2017

## (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක  දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

101 වන අධිකාරයේ 205 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය, එහි 205 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"යම් නඩුවක නඩු තීන්දුවේ, තීන්දු ප්‍රකාශයේ හෝ නඩු කටයුතු වාර්තාවල සහතික පිටපත් ලබා ගැනීමට තැනැත්තන්ට හිමිකම තිබිය යුතු බව

**205.** (1) අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, නඩුවක අදාළ පාර්ශ්වකරුවන් විසින් නඩුවේ නඩු තීන්දුවේ හෝ අවසන් තීන්දු ප්‍රකාශයේ සහතික පිටපතක් ඉල්ලුම් කරනු ලබන අවස්ථාවක දී, ඒ එක් එක් පාර්ශ්වකරු වෙත එහි එක් සහතික පිටපතක් ගාස්තු අය කිරීමෙන් තොරව නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව-

(අ) යම් තැනැත්තකු විසින්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි ගාස්තුවක් සහ අවශ්‍ය මුද්දර සපයමින් ඉල්ලීමක් කරනු ලැබූ විට, යම් නඩුවක නඩු තීන්දුවේ, තීන්දු ප්‍රකාශයේ හෝ නඩු කටයුතු වාර්තාවල හෝ ඉන් යම් කොටසක පිටපත් එකී තැනැත්තා වෙත සැපයීම; හෝ

(ආ) යම් තැනැත්තකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට සහ අවශ්‍ය මුද්දර සපයනු ලැබූ

විට ඒ තැනැත්තා විසින් පිළියෙල කරනු ලැබ ඇති ඒ පිටපත් පරීක්ෂා කර ඒවායෙහි නිරවද්‍යතාව සහතික කිරීම,

අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සිදු කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, විවාහ නඩුවක, ළමයින් දරුකමකට හදා ගැනීම සඳහා වූ ඉල්ලීමක හෝ දරුවන්ගේ භාරකාරත්වය පිළිබඳ ඉල්ලීමක පාර්ශ්වකරුවකු නොවන යම් තැනැත්තකුට, එකී නඩුවේ හෝ ඉල්ලීමේ නඩු තීන්දුව, ආඥාව හෝ තීන්දු ප්‍රකාශය හැර, එකී නඩුවේ හෝ ඉල්ලීමේ යම් නඩු කටයුතු වාර්තාවල හෝ ලේඛනවල සහතික පිටපත් ලබා ගැනීම සඳහා හිමිකමක් නොතිබිය යුතු යඃ

එසේම, තවදුරටත්, එකී විවාහ නඩුවක, ළමයින් දරුකමට හදා ගැනීම සඳහා වූ ඉල්ලීමක හෝ දරුවන්ගේ භාරකාරත්වය පිළිබඳ ඉල්ලීමක පාර්ශ්වයක් නොවන ඉල්ලුම්කරුවකුගේ අවශ්‍යතාව පිළිබඳ සෑහීමකට පත්වීමෙන් පසුව, අධිකරණය විසින්, එකී නඩුවේ හෝ ඉල්ලීමේ නඩු කටයුතු වාර්තාවල හෝ ලේඛනවල සහතික පිටපත් එකී ඉල්ලුම්කරු වෙත නිකුත් කිරීමට, එකී අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට විධාන කරනු ලැබිය හැකි ය.

(3) (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ 76 වන වගන්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකරණයක් විසින් ඉලෙක්ට්‍රොනිකව නිකුත් කරන ලද හෝ සම්ප්‍රේෂණය කරන ලද ලේඛනයක්-

(අ) එකී ලේඛනය මුලින් ඉලෙක්ට්‍රොනික ආකෘතියෙන් නිර්මාණය කරනු ලැබ ඇත්නම්, එහි රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ තම නම සහ නිල නාමය සමඟ තම අත්සන තැබීමට නීතිය මගින් බලය පැවරී ඇති එවැනි වෙනත් නිලධරයකුගේ ඉලෙක්ට්‍රොනික අත්සන

සහ ඉලෙක්ට්‍රොනික මුද්‍රාව, අධිකරණයේ ඉලෙක්ට්‍රොනික මුද්‍රාව සහ දිනය අන්තර්ගතව ඇති අවස්ථාවක දී; හෝ

(ආ) එකී ලේඛනය මුලින් කඩදාසි ආකෘතියෙන් නිර්මාණය කරනු ලැබ පසුව පෝටබල් ඩොකියුමන්ට් ෆෝමැට් (පී.ඩී.එෆ්.) ආකාරයෙන් හෝ ඊට සමාන වෙනත් ගොනු පරිවර්තන තාක්ෂණයක් මගින් ඉලෙක්ට්‍රොනික පිටපතක් බවට පරිවර්තනය කරනු ලැබ ඇත්නම්, එහි රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ තම නම සහ නිල නාමය සමඟ තම අත්සන තැබීමට නීතිය මගින් බලය පවරනු ලැබ ඇති එවැනි වෙනත් නිලධරයකුගේ අත්සන සහ මුද්‍රාව, අධිකරණයේ මුද්‍රාව සහ දිනය අන්තර්ගතව ඇති අවස්ථාවක දී,

සත්‍යවත්භාවය සහතික කිරීමේ සහ සත්‍යාපනය කිරීමේ කාර්ය සඳහා, එකී ලේඛනය අධිකරණය විසින් අත්සන් යොදා, මුද්‍රාව තබා, දිනය යොදා ඇති බවට සලකනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.